## 1 : 1 හැඳින්වීම

ලෝකයේ විවිධ ජාතීන්ට අයත් වූ මානව කණ්ඩායම් වාසය කරති. එමෙන්ම ශ්‍රී ලංකාවද, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් වැනි ජාතීන්ගෙන් සමන්විත වූ බහුවාර්ගික, බහු භාෂාමය, බහු සංස්කෘතික හා බහු විධ සමාජයකින් යුක්ත වූ රටකි. එය සෑම ජාතියකටම ඔවුන්ටම විශේෂ වූ සංස්කෘතික අනන්‍යතාවයක් ඇත. ඒ අනුව ක්‍රි.ව 1815 න් පසු දකුණු ඉන්දියාවෙන් මෙරටට ගෙන්වන ලද වතුකර ජනතාවටද ඔවුන්ටම ආවේණික සංස්කෘතියක් ඇත. දකුණු ඉන්දියානු සංස්කෘතිය තුළ මොවුන් මෙරටට ගෙනා ආගම, භාෂාව හා කලාව වැනි සංස්කෘතික සාධක ශ්‍රී ලංකාව තුළ ඔවුන්ටම ආවේණික වූ ලක්ෂණයන් සහිතව වැඩෙන්න විය.

නමුත් ජාතික ආර්ථිකයට කැපී පෙනෙන දායකත්වයක් සපයන මෙම වතුකර ජනතාවගේ සංස්කෘතිය පිළිබඳව සොයා බලා එය ආරක්ෂා කර ගැනීමට හෝ ඔවුන්ට එවැනි සංස්කෘතියක් තිබේද කියා හෝ පිළිබඳව සොයා නොබැලීම ඉතාම කණගාටුදායක කරුණකි. මෙහිදී ඔවුන්ගේ සංස්කෘතියේ විශේෂ ලක්ෂණයක් ලෙසට එම ජනතාවගේ සංගීතය හඳුන්වා දිය හැකිය. මෙම වතුකර ජනතාවටම අනන්‍ය වූ සංගීතය ගතහොත් එය වතුකරයේම හැර දිවයිනේ වෙනත් කවර ප්‍රදේශයන්හි හෝ දක්නට නොලැබේ.

සංගීත ක්ෂෙත්‍රයෙහි වතුකර ජනතාවගෙන් සංගීතයට ඇත්තේද අඩු සැලකිල්ලකි. ඊට හේතුව වී ඇත්තේ ශ්‍රී ලංකාව තුළ ඇති බහුවාර්ගික, බහු ආගමික හා බහු සංස්කෘතික අනන්‍යතාවයන් හඳුනා නොගැනීමයි. එහිදී අනෙකුත් ජාතීන්ට හා එම ජාතීන්ගේ සංස්කෘතිකාංගයන්ට මෙන්ම ඔවුන්ගේ අනන්‍යතාවයන්ට ගරු කිරීමට වත්මන් සමාජය හුරුවී නැත. එම නිසා මෙම වතුකර ජනතාවගේ සංගීත භාවිතය පිළිබඳව ඔවුන්ට නිසි අවබෝධයක් නොමැති අතර එය හඳුනාගෙනද නොමැති බව දක්නට ලැබේ. එලෙස හඳුනා නොගත් මෙම වතුකර ජනතාවගේ සංගීත භාවිතයන් පිළිබඳව හඳුනාගැනීමක් මෙම නිබන්ධන පර්යේෂණය තුළින් සිදුවේ. එමෙන්ම මෙම නිබන්ධනය හරහා අවධානයට ලක් නොවූ මෙම වතුකර ජනතාවගේ සංගීත භාවිතයන් පිළිබඳව ලාංකික ජනතාව දැනුවත් කිරීම හා ඒ පිළිබඳව අවධානයක් යොමු වනු ඇතැයිද මම සිතමි.

වතුකර ජනතාව එදා මෙදා තුර ශ්‍රී ලාංකාවේ ප්‍රධාන ආර්ථිකයට විශිෂ්ඨ දායකත්වයක් සපයමින් ශ්‍රී ලංකාවේ වාසය කළද ඔවුන්ගේ සංස්කෘතිය, ආර්ථිකය, අධ්‍යාපනය හෝ ජීවන තත්වය දියුණු කිරීමට කිසිදු උත්සාහයක් ගෙන ඇති බවක් නොපෙනේ. අඳුරු ලයින් කාමර තුළ ජීවත්වන මොවුන්, මූලික අවශ්‍යතාවයන්ද සපයා ගනු ලබන්නේද ඉතා අපහසුවෙනි. විශේෂයෙන්ම එවන් වූ ජනතාවකගේ සෞන්දාර්යත්මක කුසලතාවයන් සමාජීය වශයෙන් හෝ දේශපාලනික වශයෙන් හෝ අවධානයට පාත්‍ර නොවීම කණගාටුවට හේතුවකි. ඒ අනුව ඔවුන්ගේ සෞන්දාර්යාත්මක කුසලතාවයන් දියුණු කිරීමට හෝ ඔවුන්ටම අනන්‍ය වූ සංගීත ක්‍රම වේදයක් කියා හෝ කිසිවෙකු විසින් සොයා බැලීම කාලීන අවශ්‍යතාවයක් බව සඳහන් කළ යුතුවේ.

මෙම වතුකර ජනතාව දෛනික කටයුතු කරගෙන යාමේදී අප්‍රමාණ ශ්‍රමයක් වැය කරමින් ඉතා කටුක රැකියාවක් කරති. එහිදී මුළු ජීවිතයම වතුකරයට දියවී යන මෙම ජනතාවගේ දෛනික ජීවිතයේ ඔවුන් විඳින අප්‍රමාණ දුක් ගැහැට උදෙසා මනෝ චිකිත්සක ක්‍රමයක් ලෙස මෙන්ම ආධ්‍යාත්මික වර්ධනයට සංගීතයෙන් විශාල පිටුවහලක් වේ.

කවර සමාජයක් හෝ  සතුව  පවතින සංස්කෘතියක් උස්පහත් හෝ දියුණු නොදියුණු ආදී ලෙසට වර්ගීකරණය කළ කර නොහැකි වුවද, මෙම වතුකර ජනතාවගේ සංස්කෘතිය මෙන්ම ඔවුන්ගේ සංගීතයද කිසිවකු විසින් නොසලකා හැර ඇත. වතුකර ජනතාව හා සිංහල ජනතාව අතර සබඳතා පැවතුනද, එම සබඳතා වඩාත් එකිනෙකා හා බැඳුනු ශක්තිමත් සබඳතාවයන් නොවේ. එසේම එකිනෙකා අතර අදහස් හුවමාරු කරගැනීමේදී භාෂාමය ගැටළු පැන නගී. ඒ අනුව සන්නිවේදනයේ දුර්වලතාවයක් මතද මෙම තත්වය උද්ගත වී ඇති බව කිව හැකිය.

තවද වතුකර ජනතාවට සාමාන්‍ය ජීවිතයේ ජන කොට්ඨාශ වලට මෙන් විනෝද වීමේ අවස්ථාවක්, කාලයක් හෝ ඒ සඳහා වූ සුදුසු ස්ථානයක්ද ඇති බවක් නොපෙනේ. නමුත් ඉන් අධෛර්යට පත් නොවන ඔවුන් තමන් සතු නිසග හැකියාවන් උපරිමව යොදා ගනිමින් විවිධ අවස්ථා වලදී තම නිර්මාණයන් එළි දැක්වීමට ගනු ලබන අප්‍රතිහත ධෛර්ය කදිම ආදර්ශයකි.

මෙවැනි ව්‍යාකූල සමාජයක හිරවී සිටින මෙම දක්ෂතාවයෙන් පිරිපුන් වතුකර ජනතාව ඉන් මුදවා ගැනීමටත්, සිංහල හා දෙමළ ජනතාව අතර සංස්කෘතිමය සබඳතාව තර කිරීමත් කාලීන හා සමාජීය වශයෙන් වැදගත් කාරණයකි. ඒ සඳහා මෙම පර්යේෂණ නිබන්ධනයෙන් හෝ යම් කාර්යයක් ඉටු වේ යැයි මම සිතිමි.

'වතුකරයේ සංගීත භාවිතයන්' යන මාතෘකාව මා විසින් තෝරා ගනු ලැබුවේ මා ජීවත්වන ප්‍රදේශයට යාබදව පහතරට වතුකර කිහිපයක් දක්නට ලැබීමත් සමගම ඔවුන් විඳින දුක්ඛිත ජීවිතයන් පිළිබඳව පර්යේෂණයක් සිදු කළ යුතුයි යන්න සිතට කාවැදීමෙනි එමෙන්ම විශ්ව විද්‍යාලයේ මාගේ අධ්‍යන විෂය සීමාවටද සමගාමී වන සේ වතුකර ජනතාවගේ සංගීත ක්ෂේත්‍රය තෝරා ගැනීමට මා උත්සුක විය.

මෙලෙස 'වතුකර ජනතාවගේ සංගීත භාවිතයන්' යන මාතෘකාව තෝරා ගත් මට එම පර්යේෂණය සිදු කිරීමේදී ගැටළු රාශියකට මුහුණ පාන්නට විය. විශේෂයෙන්ම සිංහල මාධ්‍යයෙන් දෙමළ ජනතාව පිළිබඳ කෘතියක් සම්පාදනය කිරීම ඉතාම අසීරු විය. එහිදී භාෂාව පිළිබඳව වූ ගැටළුව මෙහිදී ප්‍රබල ලෙස බලපෑවේය. එනම් ද්‍රවිඩ ජනතාව පිළිබඳව සම්පාදනය වූ කෘති අල්පමාත්‍රයක් පමණ තිබූ අතර එයින්ද වතුකර ජනතාව පිළිබඳව මෙන්ම ඔවුන්ගේ සංගීතය පිළිබඳව ලියැවී ඇති කෘති තිබුණේ අතේ ඇඟිලි ගණනටය තවද දෙමළ භාෂාවෙන් ලියැවී තිබූ කෘති තිබුණද ඒවා පරිවර්තනය කිරීමේදී ඉමහත් අසීරුතාවයට පත් වූයේ පරිවර්තනය කිරීමේ හැකියාව ලත් පුද්ගලයින් සිටියද, ඔවුන්ට සංගීතය පිළිබඳව අවබෝධයක් නොතිබීමයි.

එමෙන්ම අවධානයට ලක් නොවූ විෂයක් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී අසීරුතා මතුවිය. එනම් වතුකරයන්හි සිදු කළ ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයනයන්හිදී භාෂාව පිළිබඳ ගැටළුවට තවදුරටත් මුහුණ පෑමට සිදුවිය. එහිදීද පරිවර්තකයින් යොදා ගැනීමට සිදු වූ අතර ඇතැමුන්ට භාෂාමය හැකියාව පැවතියද සංගීතමය දැනුම තිබූ පුද්ගලයින් අල්ප විය.

තවද මොවුන් සාක්‍ෂරතාවය අතින් දුර්වල පිරිසක් වූ බැවින් දත්ත රැස්කරගැනීමේදී තරමක් අසීරුතාවයට පත්වන්නට විය. එමෙන්ම වතුකරයන්හි උදෑසන වැඩට පිටත් වන මොවුන් නැවත පැමිණෙන්නේ සවස බැවින් ඔවුන්ට පහසු කාලය අනුව අධ්‍යයනය කරගෙන යාමට සිදු විය. එහිදී ඉමහත් කැපවීමකින් යුක්තව කාලය වැය කිරීමට මා හට සිදුවිය.

කෙසේ වුවද ඉහතින් පැන නැගී ගැටළු විසදා ගනිමින් මා විසින් මෙම පර්යේෂණය සිදු කළා යැයි මට හැගෙන්නේ අවසානයේදී මා ලද ආත්ම තෘප්තිය නිසාවෙනි. මන්ද සමාජය විසින් කොන් කර සිටින ජනතාව අතරට මා ගිය විට ඔවුන්ගෙන් මා ලද ආගන්තුක සත්කාර හා ඔවුන්ගෙන් ලද නොමද සහයෝගය මට ඉමහත් ප්‍රීතියක් ලබා දුන් අතර අද වන විට උඩරට හා පහතරට වතුකරයන්හි ඇතැම් පිරිස් සමඟ සබඳතාවයන් පවත්වාගැනීමටද මට හැකි වූයේ මෙම පර්යේෂණ නිබන්ධනය හරහා වීම වැදගත් වේ.

මෙහිදී වතුකර ජනතාවගේ සංගීත භාවිතයන් විවිධ ප්‍රවේශයන් ඔස්සේ විමසා බලමින් ඒ පිළිබඳව ගවේෂණය කිරීමට මෙමගින් උත්සාහ කලෙමි. එහිදී උඩරට හා පහතරට වතුකරයන් ආශ්‍රිතව මා විසින් සිදු කරනු ලැබූ ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයනයන් පදනම් කරගෙන ලැබූ ප්‍රයෝගික අත්දැකීම් භාවිතයට ගනිමින්ද මෙම පර්යේෂණ නිබන්ධනය සම්පාදනයට මම උත්සාහ ගතිමි.